## සිංහල බෞද්ධයන්ට එරෙහි අමනයෝ

සෝම හාමුදුරුවන්ගෙ දේහය පිළිබඳ ආදාහනයට පෙර හා ඉන් පසුව සිදු වූ සිද්ධි පිළිබඳ කරුණක් දෙකක් සඳහන් කළ යුතු ය. සෝම හාමුදුරුවන්ට ගරු කිරීමට අවසන් පූජා පැවැත්වීමට පැමිණි සෙනග ඉතා සංවර ව මනා සංයමයකින් යුතුව හැසුරුණු බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇතත් ඒ ගෞරවයවත් සිංහල බෞද්ධයන්ට දීමට අකමැති සිංහල බෞද්ධ විරෝධීන් ඇතැම් පුවත්පත්වල මෙන් ම රාජ්‍ය ආයතනවල ද ඇති බව ලියැවුණු හා කියැවුණු ප්‍රකාශවලින් දැනගත හැකි ය. ආදාහනයට පෙර දින කිහිපයෙහි රටෙහි බිහිසුණු ප්‍රචණ්ඩ වාතාවරණයක් තිබූ බව පෙනෙන්නට ඇත්තේ සිංහල බෞද්ධ විරෝධී කසිකබල් ප්‍රබුද්ධයන්ට පමණකි. මේ ඊනියා ප්‍රබුද්ධයන් තමන් මහා ජනමාධ්‍යකරුවන් යැයි සිතමින් විදේශවල, එනම් තමන්ගෙ ස්වාමීන්ගෙ රටවල රැකියා සොයා ගිය ද ඔවුන්ට අඩුම තරමින් පෝටර්වරයකු ලෙස පුවත්පත් කාර්යාලයක් අතුගෑමේ රැකියාවක්වත් නොලැබේ. බ්‍රිතානි ගුවන් විදුලි සේවාවට තම සංස්කෘතික ආධිපත්‍යය පවත්වාගෙන යෑම සඳහා සංදේශය වැනි අගුපිල් සේවයක් අවශ්‍ය බැවින්, එවැනි දීන සේවාවල රැකියා සඳහා සිංහල බෞද්ධ විරෝධී සිංහලයන් කිහිප දෙනකු අවශ්‍ය වෙයි. එහෙත් මෙරටින් යන සියළුම දීනයන්ට සංදේශය අගුපිලේ රැකියා නොමැති බැවින් මේ දීනයෝ තෙල් පිරවුම් හල්වල තෙල් පුරවා ටික කලකින් ආපසු ලංකාවට පැමිණෙති. එසේ පැමින කඩමාළු ඔස්සේ තම දීනත්වය ප්‍රකාශ කරති. සුද්දන්ගෙ රටේ තෙල් ගහපු එකා මෙරට ප්‍රබුද්ධ ජනමාධ්‍ය වේදියෙක් වෙයි. තෙල් පුරවන්නන්ට මෙයින් යම් අපහසුතාවයක් අත් වේ නම් මම ඒ ගැන කණගාටු වෙමි.

අදාළ දින කිහිපයෙහි පොස්ටර කිහිපයක ක්‍රිස්තියානි ආගම්කරණයට විරුද්ධ ප්‍රකාශ මෙන් ම සෝම හාමුදුරුවන්ගෙ අපවත්වීම පිළිබඳ සැකපහළ කරන ප්‍රකාශ ද ඇතුළත් වූ බව රහසක් නොවේ. ඒ පෝස්ටර ඇළවූයේ කවුරුන්දැයි මම නොදනිමි. එහෙත් සෝම හාමුදුරුවන්ගෙ අපවත්වීම පිළිබඳ ව සැක ඇත්තේ ඊනියා අන්තවාදීන් ටික දෙනකුට පමණකැයි කියමින් හිස් වූ තම පැස්බර හිස් පත්තර පිටුවල සඟවා ගැනීමට කටයුතු කිරීම නම් ඉතා අහෝඝන විහිළුවක් වෙයි. ඊනියා අන්වාදීන් ටික දෙනකුට පමණක් නොව, සිංහල බෞද්ධයන්ගෙන් අති විශාල පිරිසකට ඒ පිළිබඳ සැක ඇත. එයට හේතුව පසුගිය සතියේ ලිපියෙන් මම පැහැදිලි කෙළෙමි. බටහිර ක්‍රිස්තියානි රටවල් තම ආධිපත්‍යය පවත්වාගෙන යන අන්දම දන්නා අය අද ඊනියා ප්‍රබුද්ධ පත්තර කන්තෝරුවල හැර සමාජයේ බොහෝ තැන්වල දක්නට හැකි ය. සිංහල බෞද්ධයන්ගෙ සැකය තහවුරු වේද නැත්ද යන්න වෙන ම ප්‍රශ්නයකි. එහෙත් සැකයට පදනමක් ඇත. මෙරට ඊනියා ප්‍රගතිශීලී වෙසින් පෙනී සිටිය ද ක්‍රිස්තියානි අධිරාජ්‍යවාදී ගැත්තන් වූ මේ බත් බැලයෝ තම හාම්පුතුන්ට ද වඩා අධිරාජ්‍යවාදී වෙති. ඩයනාගෙ මරණය ගැන සැක පහළ කරන අරාබීන් එංගලන්තයේ ම ඒ සැක ප්‍රකාශ කළ ද මේ නිවට බත්බැලයන්ට අනුව සිංහල බෞද්ධයන්ට එවැනි සැකයක් ඇතිකර ගැනීම පවා තහනම් ය.

මොවුන්ගෙන් ඇතැමකුට සෝම හාමුදුරුවන් වෙනුවෙන් වීදි පුරා කොඩි දැමීම පෙනුණේ නත්තල් උත්සවය වෙනුවෙන් සරසා තිබූ නගරය කෙළෙසීමක් ලෙස ය. එය නත්තලට එරෙහිව කරන ලද්දක් ලෙස මේ බත්බැලයෝ දුටුවෝ ය. මේ ඊනියා නත්තල් සැරසිලිවලට අකමැති සිංහල කතෝලික බැතිමත්තු ද වෙති. ඔවුහු අර බත්බැලයන් මෙන් සෝම හාමුදුරුවන් සම්බන්ධයෙන් කොඩි දැමීම ගැන විරුද්ධ නොවූහ. එහෙත් මෙහි දී නොකියා ම බැරි කරුණක් වෙයි. මෙරට සිටින කතෝලික හා ක්‍රිස්තියානි බැතිමතුන්ගෙ ප්‍රතිශතය කුමක් ද? දැනට වසර දෙක තුනක සිට නත්තල වෙනුවෙන් නගර සරසන්නේ මේ ප්‍රතිශතය පිළිබිඹු වන ආකාරයකට ද? අර කසිකබල් ප්‍රබුද්ධයෝ දෙමළ ජනතාව වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයට වුවත් සූදානම් ව පසුවෙන පිරිසක් යැයි කියාගනිති. ඔවුහු එතරම් ම ප්‍රබුද්ධයෝ වෙති. එහෙත් දෙමළ හින්දු දීපවාලී උත්සවය වෙනුවෙන් හෝ තෛපොංගල් උත්සවය වෙනුවෙන් හෝ මෙලෙස වීදි සරසනු ලබන්නේ ද? ප්‍රබුද්ධයන් ද ඇතුළු සියළු විජාතික බලවේග හින්දූන් යොදා ගන්නේ සිංහලයන්ට පහර දීමට පමණ ය. විජාතික බලවේගවල අරමුණ ඉටු වූ පසු හින්දූන් මිරිකන ලද දෙහි ලෙල්ලක් මෙන් විසි කෙරෙනු ඇත.

නත්තල වෙනුවෙන් කෙරෙන සැරසිල්ල යේසුස් වහන්සේ වෙනුවෙන් නොවන බව යේසු බිළිඳාගෙ වයසේ බිළිඳුන්ට වුව ද තේරුම් ගත හැකි ය. මාසයකට වැඩි කාලයක් තිස්සේ කෙරෙන මේ සැරසිල්ල ආක්‍රමණශීලී වූවකි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය තරම් ආක්‍රමණශීලී සංස්කෘතීන් ලෝකයේ තිබී ඇත්නම් ඒ අතේ ඇඟිලි සංඛ්‍යාවට වඩා අඩු

© Prof. Nalin De Silva

විය යුතු ය. මෙරට නත්තල් වීදි සැරසිල්ල සිංහල බෞද්ධයන්ට එරෙහිව කෙරෙන තවත් ආක්‍රමණශීලී කටයුත්තක් පමණකි. එය ක්‍රිස්තියානි සංස්කෘතිය බලහාත්කාරයෙන් තම ආධිපත්‍යය සිංහල බෞද්ධයන් වෙත දමා ගැසීමකි. එහෙත් සිංහල බෞද්ධයන් සෝම හාමුදුරුවන් වෙනුවෙන් කොඩි දැම්මේ එයට පළිගැනීමක් වශයෙන් හෝ විරෝධය දැක්වීමක් වශයෙන් හෝ නොවේ. එහෙත් තමන් ප්‍රබුද්ධයන් යැයි සිතාගෙන සිටින අමනයන්ට නම් ඒ පෙනෙන්නේ එලෙස ය. මේ තකතීරුවන් මාසයක් පුරා ඇතැමුන් විසින් කෙරෙන මේ ක්‍රිස්තියානි සංස්කෘතික ආක්‍රමණික සැරසිල්ල ගැන වචනයක් වත් කතා නොකරන්නේ ඇයි? නැවැත්විය යුතුව ඇත්තේ ආගමක මුවාවෙන් කෙරෙන මේ සංස්කෘතික ආක්‍රමණය වෙයි.

මෙරට ජනාධිපතිනිය වශයෙන් තේරී පත් වී සිටින කාන්තාවට ද කිසි දිනෙක සිංහල බෞද්ධයන්ගේ ගුණයක් නම් නොපෙනෙයි. සෝම හාමුදුරුවන් සම්බන්ධ කටයුතුවල දී පොලිස් නිලධාරීන් ගෙන්වා ඇය කියා සිටියේ ද සිංහල බෞද්ධයන්ගෙන් විය හැකි ඊනියා හිංසාකාරී කටයුතු ගැන ය. මේ කාන්තාව දෝන කතිරිනාවක කිරීමට තරම් විමලධර්මසූරිය කෙනකු නැතිවීම මෙරට ප්‍රධාන ගැටළුවක් වෙයි. සෝම හාමුදුරුවන් ද ඇතුළු භික්ෂූන් වහන්සේ හා ගිහි සිංහල බෞද්ධයන් බොහෝ දෙනකු පළාත්බද ව ද පෙන්වා දුන් කරුණක් වූයේ බෞද්ධයන් ක්‍රිස්තියානි කරන කණ්ඩායම් සිය ගණනක් මෙරට ක්‍රියාත්මක වන බව ය. පූජ්‍ය ඕමල්පේ සෝභිත හිමිපාණන්වහන්සේ උපවාස කරන තුරු වගකිවයුත්තන්ට ඒ පිළිබඳ ව කිසිවක් කිරීමට නොහැකි විය. (බල ලෝභීන් පිරිසක් මේ උපවාසය ද ගසා කෑමට උත්සාහ කිරීම නිසා එහි ගුණය අඩු නොවේ.) රටේ තැන තැන සෝම හාමුදුරුවන්ගේ ආදාහනයට පෙර ද බෞද්ධයන් ක්‍රිස්තියානි කිරීමේ වැඩපිළිවෙලට සම්බන්ධ ඇතැම් ගොඩනැගිලිවලට අලාභහානි කිරීම් සිදු විය. ජනාධිපතිනියට මෙන් ම ඊනියා ප්‍රබුද්ධ ඇම්බැට්ටයන්ට ද මේ අලාභහානි කිරීම් මහා විශාල ප්‍රශ්නයක් විය. සිංහල බෞද්ධයන්ගේ හිංසා ක්‍රියාවලට, අන්‍යාගම් නොඉවසීමට මේ සාධක විය.

මොවුන් අමතක කළ කරුණු රාශියක් විය. මෙවැනි ක්‍රිස්තියානිකරන ලංකාවේ මෙන් ම ඉන්දියාවේ ද හින්දූන්ට විරුද්ධව ද ක්‍රියාත්මක වන බව පළමුවැන්න ය. ඉන්දියාවේ හින්දූ ජනයා සිංහල බෞද්ධයන්ගේ විරුද්ධත්වය පරයන ආකාරයෙන් ඒ ක්‍රිස්තියානිකරන ආක්‍රමණයට (ඒ ආක්‍රමණයකි) විරුද්ධව කටයුතු කර ඇති බව දෙවැන්න ය. තුන්වනුව එහි දී ඉන්දියාවේ හින්දූ ජනයා ක්‍රියාකර ඇත්තේ ගාන්ධිවාදී අවිහිංසාවෙන් නොවන බව අර අමන රැලට අමතක විය. එහි දී ද ඉන්දීය හින්දූ ජනයා සිංහල බෞද්ධයන් ගව් ගණනකින් පරාජය කළහ. එහෙත් ඉන්දියාවේ ආණ්ඩුව මෙන් ම ප්‍රාන්ත ආණ්ඩු ද ඒ ජනයා සමග වෙයි. ඒ ආණ්ඩු හින්දූන්ට විරුද්ධව චෝදනා කරමින් පොලිස් නිලධාරීන්ට නීතිය ක්‍රියාත්මක කිරීමට උපදෙස් නුදුන්නේ ය. ඒ වෙනුවට ක්‍රිස්තියානිකරණයට විරුද්ධව නීති සම්පාදනය කිරීමට ඒ ආණ්ඩු කටයුතු කර ඇති බව අමනයන්ට අමතක වූ සිව්වැනි කරුණ විය. මෙරට ප්‍රබුද්ධ අමනයකු හෝ ජනාධිපතිනිය හෝ වෙනත් ඇමතියකු හෝ මේ ක්‍රිස්තියානි ආක්‍රමණයට විරුද්ධව වචනයක්වත් කිසිදා කතා කර නැත. බෞද්ධයන් සියයට අනූනවයකටත් වඩා වැඩියෙන් ජීවත්වන ප්‍රදේශවල ද පල්ලි නමින් ආක්‍රමණ කඳවුරු තනන්නේ ඇයි ද යන්න සිංහල බෞද්ධ විරෝධී අමනයන්ට ප්‍රශ්නයක් නොවී ය.

සිංහල බෞද්ධයන්ට චෝදනා නැගීමට ඉදිරිපත්වන ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයේ හා පැරීසියේ ක්‍රිස්තියානි අධ්‍යාපනයක් ලබා ඇති ජනාධිපතිනිය ද ක්‍රිස්තියානි ආක්‍රමණයට විරුද්ධ නොවෙයි. මේ කිසිවකු සිංහල බෞද්ධයන්ගේ හොඳක් කීමට ඉදිරිපත් නොවීම බෞද්ධයන්ගේ ම කරුමයක් විය යුතු ය. දළදා මාළිගාවට කොටි පහර දුන් අවස්ථාවේ දී සිංහල බෞද්ධයන් කෙතරම් හොඳින් හැසුරුණේ ද යන්න මොවුහු අමතක කරති. එවැනි සිද්ධියක් ඉන්දියාවේ සිදුවිණි නම් කුමක් වීමට ඉඩ තිබුණි ද? එංගලන්තයේ වෙස්ට්මිනිස්ටර් පල්ලියට පහර දුන්නේ නම් ජනාධිපතිනිය ද අමනයන් ද ලංකාවේ සිටම ඒ ගැන විරෝධය පාන්නට තිබුණි. එවැනි අවස්ථාවක එංගලන්ත ආණ්ඩුව කෙසේ ක්‍රියාකරාවි ද යන්න ඇමරිකාව ඊනියා සැප්තැම්බර් එකොළහ පහර දීමෙන් පසුව කටයුතු කරන අන්දමෙන් පැහැදිලි වෙයි. ඔවුහු එහි ප්‍රතිඵලයක් ලෙස ඇමරිකාවට යන විදේශික පිරිස්වල ඇඟිලි සලකුණු ලබා ගැනීමට සැරසෙති. බින් ලාදන් විනාශ කිරීමට වලි කන ක්‍රිස්තියානි ඇමරිකානුවෝ දළදා මාළිගාවට පහර දුන් ප්‍රභාකරන් සමග සාකච්ඡා කරන ලෙස ලංකාවේ සිටින ඔවුන්ගේ දාසයන්ට බල කරති. ආමිටේජ් නම් ධවල නිලධාරියා මිලින්ද මොරගොඩ නමැත්තාට කියා ඇත්තේ ජනාධිපතිනිය හා අගමැති අතර ආරවුල නිසා ඊනියා සාම වැඩපිළිවෙළ (සිංහල බෞද්ධයන්ට උතුර හා නැගෙනහිර අහිමිකිරීමේ වැඩපිළිවෙළ) කඩාකප්පල් වීමට ඉඩ නොදිය යුතු බව ය. මොරගොඩ වැන්නකුට ආමිටේජ්

© Prof. Nalin De Silva

වැන්නකු සමග පින්තූරයකට පෙනී සිටීමට ලැබීම ද රටක් රාජ්‍යයක් ලැබීමක් වැනි දෙයක් බැවින් ආම්ටේජ් තමාට එසේ කී බව පවසමින් තව සති කිහිපයක් සතුටින් ගත කිරීමට හැකිවනු ඇත.

සිංහල බෞද්ධයන් තරම් අන්‍යාගම් ඉවසන පිරිසක් ලෝකයේ කොහේවත් නැත. මෙරට පල්ලියක් සෑදීමට අවශ්‍ය වන්නේ මුදල් පමණ ය. එහෙත් අමන රැල මහා ආඩම්බරයෙන් කතාකරන එංගලන්තයේ පන්සලක් පවත්වාගෙන යෑමට අවසර ගැනීම සුළුපටු කාර්යයක් නොවේ. දැන් අපි ආක්‍රමණකාරී ක්‍රිස්තියානිකරණය ගැන සලකා බලමු. තමන් සියල්ල දන්නේ යැයි සිතන ඇතැම් කසිකබල් ජනමාධ්‍යකරුවෝ (තෙල් ගසන්නෝ) බුදුන්වහන්සේ ද මිනිසුන් බෞද්ධයන් නොකෙළේ දැයි මහත් උජාරුවෙන් අසති. මේ අමනයන් නොදන්නා දේ බොහෝ ය. බෞද්ධයන් අන්‍යාගමිකයන් බෞද්ධයන් බවට හැරවීමට කිසිදා ක්‍රියා කර නැත. ධර්ම ප්‍රචාරය හෝ ලෝකයාගේ හිත සුව පිණිස දහම් දෙසීම එකකි. බලයෙන්, වංචාවෙන් හෝ වෙනත් අයුරකින් අන්‍යාගමිකයන් තම ආගමට හරවා ගැනීම තවත් එකකි. සදාචාරාත්මක ආගමට හැරවීම් යනුවෙන් ආගමට හැරවීම් වර්ගයක් නැත. ආගමට හැරවීම් එකක්වත් සදාචාර නොවේ.

බුදුන්වහන්සේ මිනිසුන් බුද්ධාගමකට හැරවීමට කටයුතු කර නැත. උන්වහන්සේගේ පණිවුඩය වූයේ අවශ්‍ය පුද්ගලයන්ට ඇවිත් බැලීමට ය. උපාලි ගෘහපති සම්බන්ධ සිද්ධියේ දී මෙය ඉතා පැහැදිලි ව පෙනී යයි. නිගන්ටනාත පුත්තගේ අනුගාමිකයකු වූ උපාලි ගහපතිට බෞද්ධ උපාසකයකු වීමට අවශ්‍ය වූ විට බුදුන්වහන්සේ අවවාද කෙළේ තව දුරටත් ජෛන පූජකවරුන්ට දන් දෙන ලෙස ය.  මිහිඳු හිමියෝ සිංහලයන් බෞද්ධයන් බවට හැරවීමේ වැඩ පිළිවෙළක් මෙරට ක්‍රියාත්මක නොකළහ. කතෝලික පූජකයන් පෘතුගාලය වෙනුවෙන් දොන් ජුවන් ධර්මපාල කතෝලික කළ ආකාරයට මිහිඳු හිමියෝ දේවානම් පියතිස්ස රජු බෞද්ධ නොකළහ. උන්වහන්සේ පළමු අවස්ථාවේ දී ම රජුට දෙසූ දෙයින් ඒ බව පැහැදිලි වෙයි. සමණා මයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා, තවෙව අනුකම්පාය  ජම්බුදීපා ඉධාගතං යන්න මෙරට බෞද්ධයෝ දනිති. අමන ප්‍රබුද්ධයෝ නොදනිති. ලෝකයා කෙරෙහි අනුකම්පාවෙන් දහම් දෙසීම, ලෝ සැරි සැරීම එකකි. ආගමකට උපක්‍රමයෙන්, බලයෙන් හෝ වෙනත් ආකාරයකින් හැරවීම තවත් එකකි. ආගමට හැරවීම් සියල්ල සදාචාරාත්මක නොවේ. පෘතුගීසීන් ඇතුළු බටහිරයන් අප වැනි රටවලට පැමිණියේ එක් අතකින් කඩුවත් අනෙක් අතින්  බයිබලයත් රැගෙන ය. බයිබලයේ ඇත්තේ අසල්වැසියාට ප්‍රේම කිරීම පමණක් නොවන බව පමණක් දැනට සඳහන් කරමි. අමනයන්ට අවශ්‍ය නම් එය මුල සිට අග දක්වා විශ්ලේෂණයකට භාජනය කළ හැකි ය. දැනට අප එසේ නොකරන්නේ අප සිංහල බෞද්ධ සදාචාරයේ පිහිටා ඇති බැවිනි.

ආම්ටේජ් වැන්නන්ගේ බහට නොරැවටී මෙරට සිංහල බෞද්ධ රටක් බව ජනාධිපතිනිය ද, අගමැති ද, බුද්ධ ශාසන ඇමති ද, ප්‍රබුද්ධ අමනයන් ද, වෙනත් අමනයන් ඇත්නම් ඔවුන් ද පිළිගන්නේ නම් මේ රටේ ප්‍රශ්න විසඳා ගැනීම අමාරුවක් නොවේ. බටහිර ක්‍රිස්තියානි දේශපාලන විද්‍යාඥයන් හා ඔවුන්ගේ මෙරට අනුගාමික ඇංකර අනුකාරකයන් කියන ආකාරයේ ඊනියා අනාගමික (සෙක්‍යුලර්) රාජ්‍ය ලෝකයේ කොහේවත් නැත. එවැනි රාජ්‍ය ඇත්තේ පොත්වල හා සඟරාවල පමණ ය. බටහිර සියළු රටවල ද, ලංකාව ඇතුළු ඇතැම් බටහිර නොවන රටවල ද  රාජ්‍ය ක්‍රිස්තියානි වෙයි. මෙරට ව්‍යවස්ථාවේ බුද්ධ ශාසනය සුරකින බවට වගන්තියක් තිබූ පමණින් රාජ්‍ය බෞද්ධ නොවේ. 1815 දී අත්සන් කළ සිංහල - ඉංගිරිසි  ගිවිසුමේ ද එවැනි වගන්තියක් විය. එහෙත් එදා සිට අද දක්වා ම මෙරට රාජ්‍යය ඇංග්ලිකන් ක්‍රිස්තියානි වෙයි. ලංකාව හැර ලෝකයේ කිසිම රටක බහුත්වවාදය (ප්ලූරලිසම්) ශක්තිමත් ආකාරයෙන් ක්‍රියාත්මක  නොවෙයි. අනෙක් රටවල ඇත්තේ දුර්වල බහුත්වවාදයකි. ඒ රටවල විවිධ සංස්කෘතීන්ට අයත් ජනයා සිටිය ද, එක් සංස්කෘතියක් ප්‍රධාන ඇතැම්විට අධිපතිවාදී සංස්කෘතිය වෙයි. එංගලන්තයේ ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතිය අධිපතිවාදී සංස්කෘතිය වෙයි. මලයාසියාවේ මුස්ලිම් සංස්කෘතිය අධිපතිවාදී සංස්කෘතිය වෙයි. ඉන්දියව ව්‍යවස්ථාවෙන් ඊනියා අනාගමික වුව ද ක්‍රියාවෙන් හින්දු රාජ්‍යයක් වෙයි. එහි හින්දු සංස්කෘතිය ප්‍රධාන සංස්කෘතිය වෙයි. ආම්ටේජ්ගේ රට ගැන කීමට අවශ්‍ය නැත. එහි ජනාධිපති බුෂ් ක්‍රිස්තියානි මූලධර්මවාදියෙක් වෙයි. මෙරට ක්‍රිස්තියානිකරණය අද සිදුවන්නේ ඇමරිකන් මුදල්වලිනි. එහෙත් ලංකාවේ පමණක් සියළු සංස්කෘතීන් සමාන ව සැලකෙයි. මේ බහුත්වවාදය නොව ශක්තිමත් බහුත්වවාදයයි. ශක්තිමත් බහුත්වවාදය හා දුර්වල බහුත්වවාදය යන සංකල්ප ක්‍රිස්තියානි දේශපාලන විද්‍යා පොත්පත්වල නැත්නම් අපට කරන්නට දෙයක් නැත. ඒ සංකල්ප අපේ පොතේ ඇතේ. ඊනියා බහුත්වවාදයක් ගැන දොඩවන අමන ඇංකරයන්ට මෙරට අධ්‍යාපනයේ බහුත්වවාදයක් ක්‍රියාත්මක

© Prof. Nalin De Silva

නොවන බව නොපෙනෙයි. මෙරට බෞද්ධ දහම් පාසල් ද, පිරිවෙන් ද ඇතුළු සියළු අධ්‍යාපන ආයතනවල අද ලැබෙන්නේ ක්‍රිස්තියානි අධ්‍යාපනයකි. අධ්‍යාපනයේ අද ඇත්තේ ක්‍රිස්තියානි ඒකාධිකාරයකි. අධිපතිවාදයකි.

එහෙත් ඒ ඒකාධිකාරයට එරෙහිව , ඒ අධ්‍යාපනයට පිටින් ගොස් විවිධ බාධක මැද අපේ ම වූ දැනුමක් සුළුවෙන් හෝ ගොඩනගා ගැනීමට අපි සමත් වී සිටිමු. එබැවින් බටහිර කසිකබල් මතවාදවලින් අප තව දුරටත් මුලා කළ හැකි නොවේ. මුළු මහත් බටහිර දැනුම ම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියක නිර්මාණය කෙරී ඇති බව අපේ දැනුමෙහි වෙයි. බටහිර භෞතික විද්‍යාව අරභයා එය ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න විද්‍යා කතන්දර පෙතේ විස්තර කෙරී ඇත. සිංහල බෞද්ධ සංස්කෘතිය යන්න අමනයන්ගේ ගෙදර තිබෙන මුවහම බවට පත් වී ඇත. ඕනෑම කරුණක දී ජනාධිපතිනිය ද අමනයන් ද සැරසී සිටින්නේ මුවහමට තඩි බෑමට ය. මෙය නැවැත්වීමට කාලය පැමිණ ඇත. අද කළ යුත්තේ අමනයන්ගේ බැටළුහම් ගලවා එහි සිටින කොටි නිරාවරණය කිරීම ය.

© Prof. Nalin De Silva